ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
🖷 011 286 4051

මගේ අංකය / எனது இல / My No. LCGD/R & D/පොදු/උරුමය /2023 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2024.01. 25

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම පළාත්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරුන්

**"උරුමය වැඩසටහන" අදියර II සහ අදියර III ආරම්භ කිරීම**

උරුමය වැඩසටහන" අදියර I ට අදාලව නිකුත් කෙරෙන නිදහස් ප්‍රදානපත්‍ර මේ වන විට සකස් කරමින් පවතින අතර එම නිදහස් ප්‍රදානපත්‍ර **2024** පෙබරවාරි **05** වන දින අදාළ ප්‍රදානපත්‍රලාභීන් වෙත බෙදා දීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව උරුමය වැඩසටහනේ අදියර I අවසන් වූ වහාම අදියර II ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

එබැවින් මගේ අංක **2023/01** සහ **2023.01.21** දිනැති චක්‍රලේඛය අනුව ඉඩම් සංවර්ධන ආඥා පනතේ **19 (2)** වගන්තිය යටතේ ලබා දී ඇති අවසරපත්‍රයක් මත ඉඩමක් නිරවුල්ව භුක්ති විඳින අවසරපත්‍ර කරුවන් වෙතින් උරුමය වැඩසටහන යටතේ පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍ර ලබා ගැනීමට ඉල්ලීමක් ලදහොත් ඇමුණුම **01** මගින් රජයට භාරගැනීමට කටයුතු කරන්න. එසේම ඉඩම් සංවර්ධන ආඥා පනතේ **19 (4)** වගන්තිය යටතේ ලබා දී ඇති දීමනාපත්‍රයක් මත ඉඩමක් නිරවුල්ව භුක්ති විඳින දීමනාපත්‍රකරුවන් වෙතින් එසේ ඉල්ලීමක් ලදහොත් උක්ත චක්‍රලේඛයේ ඇමුණුම **02** මගින් රජයට භාරගැනීමට කටයුතු කර එම ලේඛනය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට කටයුතු කරන්න.

ඉන් අනතුරුව ආ. ඒ. ආ. **118** ආකෘතිය මගින් මැනුම් ඉල්ලීමක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කල යුතු අතර එහිදී එම ඉඩම් වල පිඹුරු වලට අදාල කැබලි විස්තර ලැයිස්තුවේ යම් සංශෝධනයක් සිදු විය යුතු නම්, ඒ සඳහා වන ඉල්ලීමක්ද ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

උරුමය වැඩසටහන යටතේ පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍ර ලබා ගැනීමට රජයට භාර දෙනු ලැබූ ඉඩම් වලට අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලේඛනය සහ අනෙකුත් අදාළ ඇමුණුම් e-slims පද්ධතියට ඇතුල් කිරීම සම්බන්ධව ඉදිරියේදී ඔබ වෙත සවිස්තරව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

තවද මෙම උරුමය වැඩසටහන සඳහා ඉල්ලුම් කරන ඉඩම් වලට අදාළව,

- ජීවිත භුක්ති අයිතිය මත පවතින අවස්ථා
- ඉඩම උකස් කර ඇති අවස්ථා
- අධිකරණ කටයුතු සිදුවන අවස්ථා
- වෙනත් අයෙකුට නිසි ක්‍රමවේදයෙන් බැහැරව පවරා ඇති අවස්ථා

- පසු උරුමකරු හෝ III වන උපලේඛනගත උරුමකරු හැර වෙනත් ඥාතීන් ද ඉඩමේ පදිංචිව සිටින අවස්ථා
- ඉඩමේ ප්‍රමාණ වෙනස් වන අවස්ථා
- වෙනත් ආරවුල් පවතින අවස්ථා
- ඉඩම් හුවමාරු වීම් වැනි ලේඛන ගත දෝෂ සහිත අවස්ථා
- වෙනයම් නීතියක් සමඟ ගැටෙන අවස්ථා

යටතේ මාගේ උක්ත 2023/01 චක්‍රලේඛයේ 06 කොටසේ උරුමය වැඩසටහනේ අදියර III සම්බන්ධව දක්වා ඇති උපදෙස් අනුව එම ඉඩම් වලට අදාළ ගැටළු විසඳීමෙන් අනතුරුව විධිමත්ව තෝරා ගනු ලැබූ බලපත්‍රකරුවන්, උරුමකරුවන් වෙත නිරවුල් කරන ලද ඉඩම් පමණක් මාගේ උක්ත චක්‍රලේඛයේ 03 කොටසේ සඳහන් පරිදි උරුමය වැඩසටහනේ අදියර II ට අදාළ ක්‍රමවේදය අනුගමනය කරමින් පරම අයිතිය සහිත නිදහස් ප්‍රදානපත්‍ර ලබා දීමට අදාළ ඉදිරි කටයුතු කළ යුතුය.

ඒ අනුව මාගේ 2023/01 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ක්‍රියාත්මක කරමින් උරුමය වැඩසටහනේ අදියර II හා අදියර III ට අදාළ කටයුතු ආරම්භ කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී.බන්ධුල ජයසිංහ,
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - | කරු.දැ.ගැ.ස |
| 02. ලේකම් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | - | කරු.දැ.ගැ.ස |
| 03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - | කරු.දැ.ගැ.ස |
| 04. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව | - | කරු.අ.ක.ස |
| 05. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | - | කරු.අ.ක.ස |
| 06. අධ්‍යක්ෂක ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | - | කරු.දැ.ගැ.ස |